මගේ අංකය :- GA/2/7/297/2018 (වෙළුම I)

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,

කොළඹ 07

2024.01. 02

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සියළුම

අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් / අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන මූල්‍ය නිලධාරී

වාරිමාර්ග අධ්‍යක්ෂ/යාන්ත්‍රික අධ්‍යක්ෂ/ ව්‍යාපෘති අධ්‍යක්ෂ/

ප්‍රධාන නේවාසික ඉංජිනේරු/ ප්‍රධාන ඉංජිනේරු/

ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු/ නේවාසික ඉංජිනේරු/ යාන්ත්‍රික ඉංජිනේරු වෙත

**වාර්ෂික ස්ථාන මාරුවීම් - 2024 - තාක්ෂණ සහායක (වාරිමාර්ග/යාන්ත්‍රික)**

2024.02.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි පහත සඳහන් ස්ථාන මාරුවීම් මෙයින් නියෝග කරමි. ක්‍රියාත්මක කරනු ලබන දිනයෙහි වෙනසක් සිදු වුවහොත් පසුව දැනුම් දෙනු ලැබේ.

02. නිලධාරීන් විධිමත් පරිදි මුදාහැරීමට කටයුතු කර මුදාහරිනු ලබන දිනයත් නව සේවා ස්ථානවලට රාජකාරි සඳහා වාර්තා කරනු ලබන දිනයත් අප්‍රමාදව ප්‍රධාන කාර්යාලයට වාර්තා කළ යුතුය.

03. ස්ථාන මාරුවීම් ලද නිලධාරීන්ට ඒ බව දැනුම් දිය යුතු අතර මෙම ස්ථාන මාරුවීම් පිළිබඳ අභියාචනා ඇතොත් 2024.01.17 දිනට පෙර වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන නේවාසික ඉංජිනේරුවරුන් මඟින් ලිඛිතව මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. වෙනත් ආකාරයකින් කරනු ලබන හෝ එදිනට පසුව ලැබෙන අභියාචනා හෝ කිසිත් භාරගනු නොලැබේ.

04. මාගේ පූර්ව අනුමැතියකින් තොරව මොනම හේතුවක් නිසා හෝ ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් 2024.02.06 දිනෙන් පසු සේවා ස්ථානයේ රඳවා නොගත යුතු බව විශේෂයෙන් දන්වමි. එසේ මුදා නොහැර රඳවා ගන්නා නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන බවද වැඩි දුරටත් දන්වමි.

05. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්ව ගමන් වියදම් ගෙවිය යුතුය. උපවේෂණ දීමනා ගෙවනු නොලැබේ.

06. නිලධාරීන් ඔබ කාර්යාලයෙන් මුදාහැරීමට පෙර ඔවුන් භාරයේ තිබූ රජයේ දේපල වේ නම් ඒවා විධිමත්ව භාරගෙන ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනුවල ඇමිණීමට හැකි වන පරිදි එකී වාර්තා එවිය යුතුය. එසේම නව සේවා ස්ථානයට යවනු ලබන වැටුප් විස්තර, නිවාඩු විස්තර හා දුම්රිය බලපත් ගැනීම ආදී විස්තර හා ණය අත්තිකාරම් ශේෂ වාර්තාවේ පිටපතක් ද මා වෙත එවිය යුතුය. ස්ථාන මාරු ලැබූ රජයේ නිවාසවල පදිංචි තාක්ෂණ සහායක නිලධාරීන්ගෙන් එම නිවාස විධිමත්ව ආපසු භාර ගත යුතුය.

07. නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ පසු ඒ බව එම ආයතන ප්‍රධානියා මගින් මා වෙත වාර්තා කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දිය යුතුය.

| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය |
|---|---|---|---|
| ගාල්ල කලාපය | | | |
| 1. | ඒ.එච්.එස්.ඩී.ද සිල්වා මිය | අම්බලන්ගොඩ ප්‍රා.වා.ඉ.කා | වීරකැටිය ප්‍රා.වා.ඉ.කා |
| හම්බන්තොට කලාපය | | | |
| 2. | එච්.එම්.සී.ධර්මප්‍රිය මහතා | හම්බන්තොට ප්‍රා.වා.ඉ.කා | මාතර ප්‍රා.වා.ඉ.කා |
| 3. | ඒ.බී.එම්.රංජිත් විජේසුන්දර මහතා | වීරකැටිය ප්‍රා.වා.ඉ.කා | බදුල්ල ප්‍රා.වා.ඉ.කා |
| මොනරාගල කලාපය | | | |
| 4. | ආර්.එම්.ඩී.සී.රත්නායක මහතා | වැල්ලවාය ප්‍රා.වා.ඉ.කා | අලිකොටආර නේ.ඉ.කා |
| 5. | එස්.ආර්.අහමඩ් මහතා | බිබිල ප්‍රා.වා.ඉ.කා | අක්කරපත්තු ප්‍රා.වා.ඉ.කා |
| අනුරාධපුර කලාපය | | | |
| 6. | ඩබ්.එම්.ඒ.කේ.විජේසිංහ මහතා | අනුරාධපුර ප්‍රා.වා.ඉ.කා | රාජාංගණය ප්‍රා.වා.ඉ.කා |
| 7. | එන්.එම්.නන්දන කුමාර මහතා | රාජාංගණය ප්‍රා.වා.ඉ.කා | හුරුළුවැව ප්‍රා.වා.ඉ.කා |
| මන්නාරම කලාපය | | | |
| 8. | කේ.බාලමුගුන්තන් මහතා | සිලාවතුර ප්‍රා.වා.ඉ.කා | අනුරාධපුර ප්‍රා.වා.ඉ.කා |
| අම්පාර කලාපය | | | |
| 9. | අයි.එල්.තාහීර් මහතා | අම්පාර ප්‍රා.වා.ඉ.කා | සමන්තුරේ ප්‍රා.වා.ඉ.කා |
| 10. | බී.බී.නන්දසේන මහතා | අම්පාර ප්‍රා.වා.ඉ.කා | කන්දකැටිය ප්‍රා.වා.ඉ.කා |
| උමා ඔය ජලාශ ව්‍යාපෘතිය | | | |
| 11. | එස්.ජේ.එම්.ටී.ඒ.කේ.සමරකෝන් මහතා | අලිකොටආර නේ.ඉ.කා | වැල්ලවාය ප්‍රා.වා.ඉ.කා |
| මඩකලපුව කලාපය | | | |
| 12. | කේ.එල්.එම්.ජවාඩ් මහතා | නවකිරි ප්‍රා.වා.ඉ.කා | සමන්තුරේ ප්‍රා.වා.ඉ.කා |
| හිඟුරක්ගොඩ ජලාශ ව්‍යාපෘතිය | | | |
| 13. | ආර්.එම්.ඩී.මධුරංග මහතා | හිඟුරක්ගොඩ ජලාශ ව්‍යාපාතිය | තල්පිටිගල ජලාශ ව්‍යාපාතිය |
| 14. | යූ.ඒ.පී.එල්.අතුකෝරළ මහතා | හිඟුරක්ගොඩ ජලාශ ව්‍යාපාතිය | තල්පිටිගල ජලාශ ව්‍යාපාතිය |
| ත්‍රිකුණාමලය කලාපය | | | |
| 15. | අයි.ආර්.ජී.ඒ.එම්.බණ්ඩාර මහතා | මොරවැව ප්‍රා.වා.ඉ.කා | මින්නේරිය ප්‍රා.වා.ඉ.කා |

| | | | |
|---|---|---|---|
| බදුල්ල කලාපය | | | |
| 16. | ආර්.එම්.ප්‍රභාත් මධුශංක මහතා | මාපාකඩවැව ප්‍රා.වා.ඉ.කා | නුවරඑළිය ප්‍රා.වා.ඉ.කා |
| 17. | එම්.එම්.ටී.එන්. උපුල් කුමාර මහතා | කන්දකැටිය ප්‍රා.වා.ඉ.කා | රුගම් ප්‍රා.වා.ඉ.කා |
| 18. | එන්.එම්.එස්.උබේවර්ධන මහතා | බදුල්ල ප්‍රා.වා.ඉ.කා | වැල්ලවාය ප්‍රා.වා.ඉ.කා |

ඉංජි.අජිත් ගුණසේකර

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

ඉංජි. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

පිටපත් :

1. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය - කරු. දැ. ගැ. ස.
2. ප්‍රධාන මූල්‍ය නිලධාරි - කරු. දැ. ගැ. ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කරු. දැ. ගැ. ස.
4. ගණකාධිකාරී (වැටුප්/ ගබඩා/ අත්තිකාරම් හා පොදු තැන්පත්) - කරු. දැ. ගැ. ස.
5. සභාපති, තාක්ෂණ සහායක නිලධාරි සංගමය - කරු. දැ. ගැ. ස.
6. ලේකම්, තාක්ෂණ සහායක නිලධාරි සංගමය - කරු. දැ. ගැ. ස.
7. පෞද්ගලික ලිපිගොනුවලට